


# දේශීය මලල ක්‍රීඩාව නගා සිටුවීමට අපි ළඟ හොඳ සැලසුමක් තිබෙනවා

- මලල ක්‍රීඩා සභාපති ඩර්වින් පෙරේරා

**ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩකයන්ට උදාවී ඇත්තේ අතිශය උද්වේගකර, කාර්යබහුල තරග සමයකි. පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල, ආසියාතික ක්‍රීඩා උළෙල මෙන්ම දකුණු ආසියාතික ක්‍රීඩා උළෙලද මෙම වසර තුළ පැවැත්වීමට නියමිතව ඇති බැවින් එම කාර්ය බහුලත්වය ගොඩ නැගී තිබේ. උද්ගතව ඇති මෙම තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන්නට අපි මලල ක්‍රීඩා සංගමයේ වත්මන් සභාපති ඩර්වින් පෙරේරා මහතා මුණ ගැසුණෙමු.**

**ඔබ සභාපතිධුරය බාර ගත්තේ නව වසරේ අති තරගකාරි හා කාර්යබහුල තරග සමයක් පවතිද්දීයි. නමුත් ඔබේ පරිපාලන සමය මෙම වසරේ මුල් කාලයේදී සමාප්ත වෙනවා. යළි නිලවරණයකින් මලල ක්‍රීඩා සංගමයේ පුරප්පාඩු පිරවීමට එවිට සිදුවීම ස්වභාවයක්. මේ තත්ත්වයට ඔබ මුහුණ දෙන්නේ කොහොමද?**

මම සභාපතිධුරය භාර ගත්තේ මලල ක්‍රීඩා සංගමයේ කටයුතු අඩාල වී ඇති යුගයකදියි. දේශීය මලල ක්‍රීඩාව ඇද වැටී තිබුණ මොහොතක එය භාර ගන්න අවශ්‍ය පසුබිම මට උදාවුණා. ඉතින් මම මගේ උපරිම කුසලතා භාවිතා කර වැටුණු මලල ක්‍රීඩාව ගොඩ ගන්න කැප වෙනවා. මේ වසරේ මාර්තු මාසයේ මලල ක්‍රීඩා සංගම් නිලවරණය තිබේවි. මම ඒ ගැන දැඩිව සිත යොමු කරන්නේ නැහැ. මොකද මගේ වැඩපිළිවෙළ තමා මගේ දක්ෂතාවය අවබෝධ කර ගත්ත කම්ටු සාමාජිකයෝ නැවත වරක් මාව සභාපතිධුරයට තෝරා ගන්නා බව මට විශ්වාසයි.

**ඒ කියන්නේ ඔබ ලබන නිලවරණයේදීත් සභාපතිධුරයට තරග කරන බව හා එම නිලවරණය ජය ගන්නා බවද?**

ඔව්. මම මලල ක්‍රීඩා සංගමයේ සභාපති ධුරය ගන්නේ ලොකු සැලසුමක් ඇතිවයි. ඒ සැලසුම ක්‍රියාවට නංවන්න නම් මට තව වසරක කාලයක් අවශ්‍යයි. මගේ ළඟ හොඳ සැලසුමක් තියෙනවා. මම හොඳින් පරිපාලන කටයුතු ගැන අවබෝධයක් ලබාගෙන තියෙනවා. ඒ වගේම පුහුණු කරුවෙකු වශයෙන් හොඳ දැනුමක් ලබාගෙන ඇති බවත් ඔබ දන්නවා. ඉතින් මට යළිත් සභාපති වෙන්න බැරි නම් කාටද එහෙම වෙන්නෙ පුළුවන්.

**ඔබ මලල ක්‍රීඩා සංගමයේ වැටුප් ලබන තනතුරු කිහිපයක් හඳුන්වා දෙනවා. පුහුණු අධ්‍යක්ෂධුරයක්, පුහුණුකාර තනතුරු කිහිපයක් ඇති කර මලල ක්‍රීඩා සංගමයෙන් එකී ධුර වලට වේතනයක් ගෙවනවා. මේවට මුදල් හොයා ගන්නේ කොහොමද?**

මම කිව්වා මගේ ළඟ හොඳ සැලැස්මක් තියෙනවා කියලා. මුදල් සොයා ගන්නේ කොහොමද කියන එකත් ඒ සැලසුමේම තියෙනවා. ඒ වගේම පුහුණු කරුවන්ට වේතනයක් දෙන්න තීරණය කළේ මලල ක්‍රීඩාව නගා සිටුවන්න වගකිවයුතු පිරිසක්




ඇති කළ යුතු නිසයි. ඒ නිසා මම පුහුණු සැලසුමක් හදන්න පුහුණු අධ්‍යක්ෂවරයෙක්, ජාතික පුහුණුකරුවෙක් වගේම එක් එක් ඉසව් අනුව පුහුණුකරුවන් සිව්දෙනෙක් පත්කළා. ඔවුන්ට මාසිකව සැලකිවයුතු වේතනයක් ගෙවනවා. එමගින් හොඳ ප්‍රතිඵල ලබාගත හැකි බවයි මගේ විශ්වාසය.

**ප්‍රමුඛ පෙළ ක්‍රීඩකයන්ට හොඳින් නොසලකන බව පසුගිය කාලේ ලොකු ආන්දෝලනයක් ඇති කළ සිද්ධියක්. ඔබ වර්තමාන සභාපති වශයෙන් කොහොමද මේවට ප්‍රතිචාර දක්වන්නේ ?**

මම කියන්නේ ක්‍රීඩකයෝ තමයි මේ ක්‍රීඩාවේ වැදගත්ම පිරිස. ඉතින් අපි ඔවුන් රැකගෙන තමයි හැම දෙයක්ම කරන්නේ. මම මළල ක්‍රීඩකයන්ට හැකි උපරිමයෙන් සංග්‍රහ කරන්න සැදී පැහැදී ඉන්නේක්. මොකද මම ක්‍රීඩකයෙක් මෙන්ම පුහුණුකරුවකු වශයෙන් සිටියා. ඒ වගේම මම ක්‍රීඩා පරිපාලකයෙක් වශයෙන් හොඳ අත්දැකීම් ප්‍රමාණයක් ලබාගෙන තියෙනවා. මම මේ පම්පෝරි ගහනවා නොවෙයි. බලන්න අපි ඉදිරියේදී ක්‍රීඩකයන්ට ලබාදෙන පහසුකම් ගැන. ඔවුන්ට පෞද්ගලික අනුග්‍රහකයන් සොයා දෙන්න මම අපේක්ෂා කරනවා. දැනටමත් අපි හැකි උපරිමයෙන් ඔවුන්ට අනුග්‍රහය සලසන්න සැලසුම් කර තිබෙනවා.


**විදේශ සංචාරවලට පොරකෑම මළල ක්‍රීඩා සංගමය තුළ පවතින තත්ත්වක් බව පසුගිය අත්දැකීම් වලින් හැඟෙනවා. ඉතින් ඔබේ පරිපාලන සමයේදීත් මේ තත්ත්වයම උද්ගතවීමට ඉඩ දෙනවාද?**

නැහැ. විදේශ තරගාවලි සඳහා නිලධාරීන් පෙළපාලි යවන්න මම සූදානම් නැහැ. අදාළ සංචාරයට අවශ්‍යම සුදුසුම නිලධාරියා යවන්න තමයි මම ක්‍රියාකරන්නෙ. මම මුලදී කිව්වා වගේ අපිට වඩා වැදගත් ක්‍රීඩකයා මිස නිලධාරියා නොවෙයි. ස්වෙච්ඡාවෙන් වැඩ කරන නිලධාරීන්ටත් විදෙස් තරගාවලියකට යන්න අවස්ථාව සපයාදීම යුතුකමක් බවත් මම විශ්වාස කරනවා. නමුත් එය ක්‍රමානුකූලව විනයක් ඇතිව සිදු කල යුත්තක්.

**අනාගතයේ දේශීය මලල ක්‍රීඩාව ගැන යහපත් බලාපොරොත්තු තැබිය හැකිද?**

එයට නම් ඔබ සැමට මා කෙරෙහිත් මගේ පරිපාලන කම්ටුව කෙරෙහිත් විශ්වාසය තැබිය යුතු වෙනවා. ඔබ එයට සූදානම් නම් මගේ විශ්වාසය අනුව මලල ක්‍රීඩාව සංවර්ධනය වේවි.

**කසුන් අංජන ඉරුගල්බණ්ඩාර**




අපිට මේ රටේ මලල ක්‍රීඩාව කරවන සංගමයෙන් කිසිඳු සැලකිල්ලක් නැහැ. පසුගිය කාලයෙ අපි උන්නද, මලාද කියල බලන්නවත් බලධාරීන් ක්‍රියා කළේ නැහැ යැයි සුසන්තිකා ජයසිංහ ප්‍රකාශ කළාය. ඇය දේශීය මාධ්‍යවේදීන් හමුවේ ආගිය තොරතුරු පවසමින් මෙම තත්ත්වය අනාවරණය කළා ය.

''අපි මේ රටට පදක්කම් දිනා දීලා තිබෙනවා. එහෙම කරපු අපි ක්‍රීඩාවෙන් සමුගෙන නොසිටිද්දීත් මලල ක්‍රීඩා සංගමය අප ගැන වගේ වගක් නැහැ. පසුගිය කාලයේ මගේ ආබාධ පිළිබඳව සොයා බලලා ඒවාට ප්‍රතිකාරයක් අරන් දෙන්නවත් ඔවුන් ක්‍රියා කළේ නැහැ. ඇත්තෙන්ම මම ඉන්නේ විශාල කලකිරීමකින්' යැයි සුසන්තිකා ජයසිංහ ප්‍රකාශ කළාය.

පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලබන වසරේ පැවැත්වෙන තරගාවලි සඳහා සහභාගිවීමේ අපේක්ෂාවෙන් සිටින සුසන්තිකා ගේ මෙම ප්‍රකාශයන් පිළිබඳ මලල ක්‍රීඩා සංගමය දක්වා තිබුණේ සුබවාදී ප්‍රතිචාර නොවීමද විශේෂිතය.

## VB Series

**Jan 2006**

Fri 13 Australia v Sri Lanka Telstra Dome, Melbourne
Sun 15 Australia v South Africa Brisbane Cricket Ground
Tue 17 South Africa v Sri Lanka Brisbane Cricket Ground
Fri 20 Australia v South Africa Telstra Dome, Melbourne
Sun 22 Australia v Sri Lanka Sydney Cricket Ground
Tue 24 South Africa v Sri Lanka Adelaide Oval
Thu 26 Australia v Sri Lanka Adelaide Oval
Sun 29 Australia v Sri Lanka W.A.C.A. Ground, Perth
Tue 31 South Africa v Sri Lanka W.A.C.A. Ground, Perth

**Feb 2006**

Fri 3 Australia v South Africa Telstra Dome, Melbourne
Sun 5 Australia v South Africa Sydney Cricket Ground
Tue 7 South Africa v Sri Lanka Bellerive Oval, Hobart
Fri 10 VB Series 1st final Adelaide Oval
Sun 12 VB Series 2nd final Sydney Cricket Ground
Tue 14 VB Series 3rd final (if req.) Brisbane Cricket Ground